# ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - රිදියගම ව්‍යාපාරය

R 8414
23 FEB 2018
MO-1

දිනය - 2018/01/09

වේලාව - පෙ.ව. 9.00

ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

## සහභාගි වූ රජයේ නිලධාරීන්

### වාරිමාර්ග කළමනාකරණ අංශය

01. කේ.කේ. ඉන්ද්‍රානි මිය - නේවාසික ව්‍යාපෘති කළමනාකරු - රිදියගම ව්‍යාපාරය
02. පි.ඩබ්.ඒ.එල්.ඩී. ලක්මාලි මෙය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය
03. ඒ.කේ. නිලූකා ප්‍රියදර්ශනි මිය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය
04. එච්.කේ.ටී. දිල්මන්ති මිය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය
05. ඩබ්.එන්. ජීවන්ති වීරසිංහ මිය - සංවර්ධන නිලධාරි - රිදියගම ව්‍යාපාරය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

06. ඩබ්.එල්.එන්. බුද්ධික මයා - ප්‍රා:වාරිමාර්ග ඉංජිනේරු- ප්‍රා.වා ඉංජි කාර්යාලය - අ/තොට
07. ඩී.ආර් ජයසේකර මිය - ඉංජිනේරු සහකාර - ප්‍රා.වා ඉංජි. කාර්යාලය - අ/තොට
08. ඩබ්.සී රත්න කුමාර මයා - සංවර්ධන නිලධාරි - ප්‍රා. වාරිමාර්ග ඉංජි. කාර්යාලය - අ/තොට
09. එල්.කේ අබේධීර මයා - තාක්ෂණ සහයක - ප්‍රා. වාරිමාර්ග ඉංජි. කාර්යාලය - අ/තොට

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

10. එන්.පී.ඒ ගුණවර්ධන මයා - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - අ/තොට

### ගොවි නියෝජිතවරු

01. පී. ජී. ගුණරත්න මයා - භාණ්ඩාගාරික - මහසෙන් ගොවි සංවිධානය
02. යූ.ඩබ්. දිසානායක මයා - ලේකම් - මහසෙන් ගොවි සංවිධානය
03. ඩී.එච්. මංජු රෙජිනෝල්ඩ් මයා - භාණ්ඩාගාරික - දිමුතු ගොවි සංවිධානය
04. ඒ.ජී සැමී මයා - ලේකම් වීර ගොවි සංවිධානය
05. ඒ.පී. විමලදාස මයා - ලේකම් - ප්‍රගති ගොවි සංවිධානය
06. එම්.එම් ජයලතා මිය - සභාපති මහානාග ගොවි සංවිධානය
07. ඩී ඒ කරුණාදාස මයා - සභාපති - ප්‍රගති ගොවි සංවිධානය
08. ඩබ්.ජී ගුණපාල මයා - සභාපති - ගාමිණි ගොවි සංවිධානය
09. එම්.කේ පියදාස - ලේකම් - සරුකෙත ගොවි සංවිධානය

10 ඩී. එම් රත්නපාල මයා - සභාපති - වලව ගොවි සංවිධානය

11. හැන්ඩි අබේධීර මයා - ලේකම් - එකමුතු ගොවි සංවිධානය

12. පී. විජේසූරිය මයා - ලේකම් - රුහුණු ගොවි සංවිධානය

13. එම්.එච්.එම් අරුස් මයා - භාණ්ඩාගාරික - එක්සත් ගොවි සංවිධානය

14. ටී.පී. පිනදාස මයා - භාණ්ඩාගාරික - රුහුණු ගොවි සංවිධානය

15. එච්.ඒ.පී කරුණාදාස මයා - ලේකම් - නීල ගොවි සංවිධානය

16. එම්.එම් මහින්ද මයා - සභාපති - දිමුතු ගොවි සංවිධානය

17. යූ.පී සිරිසේන මයා - ලේකම් - පුබුදු ගොවි සංවිධානය

18. එස්.ආර්.පී චිත්‍රානන්ද මයා - සභාපති - නීල සේනාපති ගොවි සංවිධානය

19. ඒ. ජේ රංජිත් මයා - ලේකම් - විජය ගොවි සංවිධානය

20. ජේ.ඒ.පී.එස් සාන්ත මයා - භාණ්ඩාගාරික - පැරකුම් ගොවි සංවිධානය

21. ඒ.එම්. සුදුසිංහ මයා - සභාපති - ථේරපුත්ත ගොවි සංවිධානය

22. එම්.ජී. සුබසිලි මිය - සභාපති - සේනානායක ගොවි සංවිධානය

23. ඩබ්.එච්. ධන්කන් මයා - සභාපති - රුහුණු ගොවි සංවිධානය

24. ඕ.එම් ඥානතිස්ස මයා - සභාපති - ගජබා ගොවි සංවිධානය

න්‍යාය පත්‍රානුකූලව පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපෘති කළමනාකරු කේ.කේ. ඉන්ද්‍රානි මහත්මිය විසින් පැමිණ සිටි පිරිස පිළිගන්නා ලදි.

ඉන් අනතුරුව ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ ගරු ලේකම් ඒ.පී විමලදාස මහතා විසින් පසුගිය ව්‍යාපාර කළමනාකරණ කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කල අතර වාර්තාවේ සංශෝධන කිසිවක් නොවූ බැවින් සරුකෙත ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමාගේ හා එක්සත් ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් වාර්තාව සභා සම්මත විය.

**ආයතන සංවර්ධන කටයුතු - පී.ඩබ්.ඒ.එල්.ඩී.ලක්මාලි මෙනවිය - සංවර්ධන නිලධාරි**

සියලුම ගොවි සංවිධාන අවසන් ගිණුම් සකස් කර අවසන් කර මාර්තු 31 දිනට පෙර විගණන කටයුතු අවසන් කරන ලෙස සංවර්ධන නිලධාරිතුමිය දන්වා සිටි අතර 2017 දෙසැම්බර් මස ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කළාය.

## මහසභා /කාරක සභා පැවැත්වීම හා මුදල් සාරාංශ ලැබීම් - දෙසැම්බර් මාසය

| අ/අ | ගොවි සංවිධානයේ නම | 2017 වසර සඳහා නිලවරණ පැවැත්වීම | මහා සභා රැස්වීම් පැවැත්වීම | කාරක සභා රැස්වීම් පැවැත්වීම | මුදල් සාරාංශය ලැබීම | විගණනය | ව්‍යාපාර කමිටුවට පැමිණීම |
|---|---|---|---|---|---|---|---|
| 01. | මහානාග | - | - | x | √ | - | √ |
| 02. | පැරකුම් | - | - | √ | √ | - | √ |
| 03. | ගජබා | - | - | √ | √ | - | √ |
| 04. | එක්සත් | - | - | √ | √ | - | √ |
| 05. | නීලසේනාපති | - | - | x | √ | - | √ |
| 06. | විජය | - | - | x | √ | - | √ |
| 07. | සුභද | - | ✓ | √ | √ | - | X |
| 08. | සරුකෙත | - | - | √ | √ | - | √ |
| 09. | මහසෙන් | - | - | x | √ | - | √ |
| 10. | අල් අක්බර් | - | - | √ | √ | - | X |
| 11. | දිමුතු | - | - | √ | √ | - | √ |
| 12. | එකමුතු | - | - | √ | √ | - | √ |
| 13. | ථේරපුත්ත | - | - | √ | √ | - | √ |
| 14. | රුහුණු | - | - | x | √ | - | √ |
| 15. | පුබුදු | - | - | √ | √ | - | √ |
| 16. | වීර | - | - | √ | √ | - | √ |
| 17. | නීල | - | - | √ | √ | - | √ |
| 18. | සේනානායක | - | | √ | √ | - | √ |
| 19. | ඉසුරු | - | - | x | √ | - | X |
| 20. | සමගි | - | - | √ | √ | - | x |
| 21. | ගාමිණී | - | - | √ | √ | - | √ |
| 22. | කාවන්තිස්ස | - | - | √ | √ | - | X |
| 23. | ගෝඨාභය | - | - | √ | √ | - | X |
| 24. | වලව | - | - | √ | √ | – | √ |
| 25. | ප්‍රගති | - | - | √ | √ | - | √ |
| එකතුව | | - | 01 | 19 | 25 | - | 19 |

වාරිමාර්ග ගැටළු විසඳීමේ ප්‍රගතිය

| අ/අ | ඉදිරිපත් කල අය | ගැටළුව | තීරණය | වගකීම | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | පැරකුම් ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික තුමා | පැරකුම් ගොවි සංවිධානයට අයත් CPO 7 ඇළ කණ්ඩිය උස් කිරීම සිදු කර දෙන ලෙස ඉල්ලීම. | ඇස්තමේන්තු සකස් කර ඇත. | වා.දෙ. ගො.ස. | ඉටු වී නැත. ප්‍රතිපාදන ලැබුණු පසු ඉටු කර දෙන බව වාරිමාර්ග ඉංජිනේරු තුමා ප්‍රකාශ කර සිටියේය. |
| 02 | වීර ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා | ඇළේ නඩත්තු කටයුතු සඳහා JCB යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීම | කාර්යාලයට පැමිණ දිනයක් ලබා ගන්නා ලෙස වාරි.ඉංජි. තුමා දන්වා සිටී. | වා.දෙ. ගො.ස. | ඉටු වී ඇත. තවද CPO 9 සඳහා අඟලේ පයිප්ප 4 ක් වාරි:දෙ විසින් ලබා දුන් අතර එය ගොවීන් එකතු වී සකස් කර ඇත. |
| 03 | දිමුතු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමා | ලොලු ගහ ඇනිකට් එක ළඟ ඇළකණ්ඩිය කපා ජලය ලබා ගන්නා බැවින් ඒ සඳහා U - ආස්තරණයක් ඉදිකර දෙන ලෙස ඉල්ලා සිටී. | | වා.දෙ. ගො.ස. | ඉටු වී නැත. ඇස්තමේන්තු සකස් කර ඇත. |
| 04 | විජය ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | කරගස් ආර බස්නාවේ අග කොටස ශුද්ධ කර දෙන ලෙස ඉල්ලා සිටී. | | වා.දෙ. ගො.ස. | ඉටු වී නැත. ලබන කන්නයේ දී ඉටු කරදෙන බව වාරිමාර්ග ඉංජිනේරු තුමා ප්‍රකාශ කර සිටියේය. |
| 05 | ඉසුරු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමා | SLB අංක 01 පයිප්පය අයත් වන ඇල කොටස සඳහා පැති බැම්මක් ලබාදෙන ලෙස ඉල්ලා සිටී. | | | ගොවි නියෝජිතයින් නොපැමිණි නිසා මෙවර ද පසුවට කල් තබන ලදී. |
| 06 | රුහුණු ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | ජල පාලනයක් කර ගැනීමට NCB ඇල සඳහා කොන්ක්‍රීට් ආස්තරණයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටී. | | වා.දෙ. ගො.ස. | ඉටු වී නැත. ඇස්තමේන්තු සකස් කර ඇත. ලබන වසර් දී ඉටුකර දෙන බව වාරි:ඉංජිනේරු තුමා පැවසීය. |
| 07 | සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | භූවිද්‍යා හා පතල් කාර්යංශයට වැලි ප්‍රශ්නය පිළිබඳව දන්වා යවන ලෙස | ඉදිරියේ දී අදාල කටයුතු සිදු කිරීම. | නේ:ව්‍යා කළමනා කරු | ඉටු වී නැත. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී කුඹුරු ඉඩමක වැලි |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | නේවාසික ව්‍යාපෘති කළමනාකරුගෙන් ඉල්ලා සිටී.<br>තව ද භූවිද්‍යා හා පතල් කාර්යංශටය ඊලග ව්‍යාපාර කමිටු රැස්වීමට කැඳවීම් කරන ලෙසද ඉල්ලා සිටී. | | | කැපීම නිර්දේශ නොකරන ලෙසට ඉල්ලීම් කරන ලෙස වාරි:ඉංජි තුමා පැවසා සිටී. |
| 08 | පැරකුම් ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමිය | ප්‍රධාන ඇලේ කි:මි 4 කට එහායින් හබරත්තවල පාසල පිටුපසින් රෙගියුලේටරයක් ඉදි කරන ලෙස ඉල්ලා සිටී. | ඉදිරියේ දී අදාල කටයුතු සිදු කිරීම. | වා:දෙ<br>ගො:සං | අලුත් රෙගියුලේටරයක් යොදා ඇති අතර මේ අවුරුද්දේ තත්වය සොයා බලා ඉටු කර දීම.<br>(වාරි.ඉංජි) |
| 09 | සරුකෙත ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | එල්.බී ඇලේ ඇනිකට් එකට ඉහලින් ඇති ඇනිකට් එක ඉවත් කල හොත් ගොඩ ඉඩම් ජලයෙන් යටවීම වලක්වා ගත හැකි බව. | විකල්ප යෝජනා ඉදිපත්කල යුතු බව | වා:දෙ<br>ගො:සං | ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීම<br>SRB LB 3 ඇලේ 2 ඇනිකට් එකේ මැද කුළුණ ඉවත් කරීම වාරිමාර්ග කම්කරුවන් යොදා ගොවි සංවිධානය විසින් සිදු කිරීමට තීරණය විය. |
| 10 | ථේරපුත්ත ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකතුමා | අම්බලන්තොට නගරය හරහා වාදුරුප්ප ප්‍රදේශයට ජලය ගෙන යන ඇලට අම්බලන්තොට තෙල් පිරවුම්හල අසලින් අපද්‍රව්‍ය එක්වීම. | අදාල ආයතන හා සාකච්ඡාකර විකල්ප ඇල මාර්ගයක් සකස් කර ගැනීමට ඉදිරියේ දී සාකච්ඡා කරනු ලැබේ. | වා:දෙ<br>ගො:සං<br>හා<br>අදාල ආයතන | ඉටු වී නැත. ඉදිරියේ සාකච්ඡා කර බටය නිරීක්ෂණය කිරීමට තීරණය විය. |
| 11 | පුබුදු ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | සල්ගහ ලග සිට මීටර් 5-10 ත් අතර වෙලේ යාය පයිප්පය අසලින් ගොඩගම ඇල දක්වා තැනින් තැන ජලය කාන්දු වීම | PEISEIP ව්‍යාපෘතිය යටතේ ඒ පිළිබඳව සොයා බැලීමට තීරණය විය. | වා:දෙ<br>ගො:සං | 2018 ප්‍රමුඛතා ලේඛනයට ඇතුලත් කර ඇත. |
| 12 | ගජබා ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | ගොඩගමඇලේ කොන්ක්‍රීට් කර ඇති ස්ථාන කිහිපයකින් ජලය කාන්දු වීම | | වා:දෙ<br>ගො:සං | 2018 ප්‍රමුඛතා ලේඛනයට ඇතුලත් කර ඇත |
| 13 | මහසෙන් ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | කරගස් ආර දොරවල් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළුව | 20 වන දින සවස 3.00 ට ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමට තීරණය විය. | වා:දෙ<br>ගො:සං | ඉටු වී නැත.<br>2018 ජනවාරි 12 වන දින පෙ:ව 7.00ට ක්ෂේත්‍ර පරීක්ෂණයක් කිරීමට තීරණය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | විය |
| 14 | ගජබා ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | ගොඩගම ඇලේ ජල පාලනය සඳහා මුල් පයිප්ප 5 ට දොරවල් දමා ඉල්ලීම | අදාල කටයුතු සොයා බලා ඉටු කිරීම | වා:දෙ ගො:සං | ඉටු වී නැත. මෙහෙයුම් නඩත්තු යටතේ සිදු කරදීමට තීරණය විය. |

**වාරිමාර්ග කටයුතු - ඩබ්.එල්.එන් බුද්ධිකමයා - ප්‍රා.වාරිමාර්ග ඉංජිනේරු ප්‍රා.වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය අ/තොට**

**ජල තත්ත්වය**

**ජලකඳේ උස - අඩි 18 අගල් 1**

**ජලධාරිතාව - අක්කර අඩි 23550**

**ජල මුර ක්‍රමය:- ඩී.ආර් ජයසේකර මිය - ඉංජිනේරු සහකාර - ප්‍රා.වා ඉංජි. කාර්යාලය - අ/තොට**

දින 7 ක් පද්ධතියටම ජලය ලබා දී දින 3 ක් ජලය නතර කර තැබීමට ගොවීන්ගේ එකඟතාවය මත තීරණය කරන ලදී. ඒ අනුව මුර ජල ක්‍රමය යටතේ ජනවාරි 12,13,14 යන දිනයන් හි රිදීයගම වැවෙන් ජලය ලබා දීම නතර කරන අතර එතැන් සිට සතියක් ජලය ලබාදේ. මෙම ක්‍රමය යටතේ ඉදිරියට ජලය ලබා දීම සිදු කරන බව ඉංජිනේරු සහකාරවරිය පවසා සිටියාය.

**වාරිමාර්ග ගැටළු**

| අ/අ | ඉදිරිපත් කළ අය | ගැටළුව | තීරණය | වගකීම | ක්‍රියාත්මක වීමට ගත වන කාලය |
|---|---|---|---|---|---|
| 01 | ගාමිණී ගොවි සංවිධානයේ ගරු සභාපති | ගල්ලවිලයායේ බස්නාවේ සැතපුම් 3/4 ක් පමණ රොන්මඩ ඉවත් කර ඉල්ලයි. | JCB එවා ඇත. | වා:දෙ ගො:සං | |
| 02 | දිමුතු ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික | පල්ලිය ලඟ කෙත් ඇලේ අග කොටස කැඩියාම නිසා කුඹුරුවල ජලය ලබා ගැනීම අපහසු වී තිබීම | පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදු කරන බව (වාරි:ඉංජිනේරු) | වා:දෙ ගො:සං | |
| 03 | ගාමිණී ගොවි සංවිධානයේ ගරු සභාපති | SLB ඇලේ කරවිල යායේ පයිප්ප 3 ක් සඳහා දොරවල් අවශ්‍යව තිබීම | PEISEIP ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය දොරවල් ලබාදීම (වාරි:ඉංජිනේරු) | වා:දෙ ගො:සං | |
| 04 | සේනානායක ගොවි සංවිධානයේ ගරු සභාපති තුමිය | කෙත් ඇලේ අග කොටසේ ඇති පයිප්පය අබලන් වීම නිසා කුඹුරුවලට ජලය ලබා ගැනීම අපහසු බව. | ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වා සිටී. | වා:දෙ ගො:සං | |

**PEISEIP ව්‍යාපෘතිය - ඩබ්.එල්.එන් බුද්ධිකමයා - ප්‍රා.වාරිමාර්ග ඉංජි.ප්‍රා.වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය අ/තොට**

මෙම ව්‍යාපෘතිය යටතේ සියලු කෙත් ඇලවල් කොන්ක්‍රීට් කර දෙන ලෙස ගොවි නායකයන් විසින් ඉල්ලා සිටින ලදි.එයට පිළිතුරු ලබා දුන් වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසා සිටියේ ගොවි සංවිධාන මට්ටමින් ගැටළු හඳුනාගෙන කටයුතු කරන බවත් පළමුව ගාමිණී හා නීල සේනාපති ගොවි සංවිධාන තෝරා ගන්නා බවත්ය.

**පුහුණු**

පෙබරවාරි මස ව්‍යාපාර කළමනාකරන කමිටු රැස්වීම අවසන් වූ පසු පැය එක හමාරක් පමණ ජල කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ගොවි නායකයන් සියලු දෙනාට ලබා දෙන බව වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසා සිටියේය.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - එන්.පී.ඒ ගුණවර්ධන මයා - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - අ/තොට**

**වී වගාව**

දැනට දින 40 - 50 අතර වයස් මට්ටමේ පවතී.අවශ්‍ය පෝෂක ප්‍රමාණය නොලැබීමෙන් වී අස්වැන්නට බලපෑම් ඇති කරයි.දින 45 - 50 අතර කාලයේදී බණ්ඩි පොහොර යෙදීම කල යුතුය.

**රෝග පළිබෝධ**

දුඹුරුපැළ කීඩෑ හානිය හා කොළහකුළුවන දළඹුවාගේ හානිය දක්නට ලැබේ. හිතකර පළිබෝධකයින් විනාශවන නිසා අවම වශයෙන් පළිබෝධනාශක යෙදීම වැදගත් වේ. ගොයමට ජලය බැඳ තැබූ විට පළිබෝධකයින්ට බිත්තර දැමීම පහසු වේ. එවිට ව්‍යාප්තිය වැඩි වේ. ඒ නිසා තෙතමනය ප්‍රමාණවත් වේ.

**අතිරේක භෝග වගාව**

මේ සඳහා 50% සහනාධාර ක්‍රමය යටතේ බඩ ඉරිඟු බීජ ලබා ගත හැකිය.

කෙසෙල් වගා කරන භූමි ප්‍රමාණය හා ගොවීන්ගේ නම් ගොවි සංවිධාන මට්ටමින් ලබා ගෙන අදාළ තොරතුරු නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයට ලබා දෙන ලෙස ද එතුමන් ඉල්ලා සිටියේය.

ලේකම්තුමාගේ ස්තූති කථාවෙන් පසු එදිනට නියමිත ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමේ වැඩ කටයුතු නිමා විය.

| | |
|---|---|
| ලේකම් | කේ.කේ.ඉන්ද්‍රානි |
| ව්‍යාපාර කළමනාකරණ කමිටුව | නේවාසික ව්‍යාපෘති කළමණාකරු |
| රිදියගම ව්‍යාපාරය | රිදියගම ව්‍යාපාරය |

පිටපත්:- 01. අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය - කොළඹ - කා:දැ:ස
02. ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට/ හම්බන්තොට - කා:දැ:ස
03. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ.ප.) - හම්බන්තොට - කා:දැ:ස
04. අධ්‍යක්ෂ - කෘෂිරක්ෂණ මණ්ඩලය - කා:දැ:ස
05. වාරිමාර්ග ඉංජිනේරු - අම්බලන්තොට - කා:දැ:ස
06. ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි - අම්බලන්තොට - කා:දැ:ස
07. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - අම්බලන්තොට - කා:දැ:ස